**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2020**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ("ශ්‍රී ලංකා ක්‍රිකට්") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 හි 22 ඡේදයට අනුව, බදුකරු විසින් බදු ගිවිසුමේ ආරම්භක දිනයේදී වත්කම් භාවිත කිරීමේ අයිතිය සහ බදු වගකීම පිළිබඳ හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, 2020 අගෝස්තු 27 දින සිංහල ක්‍රීඩා සමාජ පරිශ්‍රය වර්ෂ පහක කාලයකට බදුදීම සම්බන්ධයෙන් වූ බදු ගිවිසුම වත්කම් භාවිත කිරීමේ අයිතිය යටතේ හඳුනාගෙන නොතිබූ අතර, මූල්‍ය ප්‍රකාශන තුළ වර්ෂයකට මිලියන 4ක් වූ බදු වගකීම් සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි. | අදහස සටහන් කරගන්නා ලද අතර 2021 වර්ෂයේදී අදාළ සටහන් පොත්වල ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව, භාවිත වත්කම් සහ කල්බදු වගකීම් පිළිබඳ සියලුම හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි බී. 5.5.4 ඡේදයට අනුව, කේවල උපකරණ පදනම මත ආයු කාලය තුළ අපේක්ෂිත ණය පාඩු මැනීමට අනවශ්‍ය පිරිවැයක් දැරීමකින් හෝ උත්සාහයකින් තොරව ලබාගත හැකි සාධාරණ සහ සහාය දිය හැකි තොරතුරු ආයතනයට නොමැති නම්, සමස්ත පදනම යටතේ ආයු කාලය අභිමිවීම් තක්සේරු කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රමිතයේ එම අවශ්‍යතාවයට පටහැණිව මූල්‍ය උපකරණ යටතේ දක්වා ඇති එකතුව රු. මිලියන | තනි තනිව ලැබිය යුතු අනුග්‍රාහකත්වය සලකා ඉතිරි මුදල් අයකරගත හැකි බව කළමනාකරණයේ අදහසයි. එය පදනම් කරගනිමින් සාමාන්‍ය හානිකරණයක් සිදුකර ඇත. | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත ප්‍රකාරව හානිකරණ පාඩු ගණනය කළ යුතුය. |

582.6ක් වූ තනි පුද්ගල අනුග්‍රාහකත්ව ලැබිය යුතු ශේෂයන් 12ක හානිකරණය සාමූහික පදනම මත ගණනය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හානිකරණ ගෙවීම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම රු. 47,438,675 ක් වූ ව්‍යාපෘති හතරක් අදාළ පළාත් පාලන ආයතනවලින් සහ නාගරික සංවර්ධන අධිකාරියෙන් අවශ්‍ය අනුමැතිය ලබානොගැනීම හේතුවෙන් ස්ථිරවම අත්හැර දමා තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රගතිය යටතේ අත්හැර දැමූ ව්‍යාපෘතිවල වටිනාකම රු. 47,438,675 ක් විය. එබැවින් 2020 වර්ෂය සඳහා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ වටිනාකම පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල වැඩිපුර දක්වා තිබුණි. | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සිදුකරන ලද කාර්යයන් අනාගත සංවර්ධනය සඳහා යොදාගැනීමට හා වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ඇගයීමක් කරන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති දකුණු අප්‍රිකානු සංචාරයේ අනුග්‍රාහකත්ව හිමිකම් සඳහා ලැබිය යුතු ආදායම වූ රු. 34,938,077 (ඇ.ඩො. 187,085) ක් එම අනුග්‍රාහක සමාගමෙන් ලැබිය යුතු බවට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඉහත ගනුදෙනුව සඳහා බලපෑම් කළහැකි සැකමුසු අක්‍රමවත් මැදිහත්වීම් හේතුවෙන් මෙම මුදල අනුග්‍රාහකත්වයෙන් ලබාගැනීම සම්බන්ධව අවිනිශ්චිත බවක් පවතී. | නීතිමය උපදෙස් මත පදනම්ව එම මුදල අයකරගත හැකි බවත්, ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල කිසිඳු දුර්වලතාවයක් හඳුනාගෙන නොමැති බවත් කළමනාකාරිත්වයේ අදහසයි. | ලෙජර් ක්‍රියාවලිය තුළින් හෝ ලැබිය යුතු ආදායම අය කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | එකතුව රු. 38,229,740ක් වූ ලැබිය යුතු රඳවාගත් බදු මුදල් වර්ෂ 5කට වැඩි කාලයක සිට අයතර නොගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුනොකර පැවතුණි. | ලැබිය යුතු රඳවාගත් බදු මුදල් අයකර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතන විසින් කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරිමට හෝ ලැබිය යුතු මුදල් අයකර |

| | | |
|---|---|---|
| | | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ගනුදෙනු සඳහා අදාළ මූලාශ්‍ර ලේඛන නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් රු. 41,495,183 ක් වූ හර ශේෂයන් දහ අටක් කපා හැර තිබුණි. | මේ සම්බන්ධයෙන් සාධාරණ හා යුක්ති සහගත ලෙස කටයුතු කර ඇත. | ණය කපාහැරීමට පෙර , ණය අයකර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බැලිය යුතුය. |

**1.6.2 ගෙවිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 16,020,449 ක් වූ අනෙකුත් ගෙවිය යුතු ශේෂයන් වර්ෂ 2 සිට 3 දක්වා කාලසීමාවක් තුළ පියවා නොතිබුණි. | මෙම ගෙවිය යුතු ශේෂයන් 2021 වර්ෂය තුල නිරවුල් කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කටයුතු කරයි. | වගකීම තහවුරු කිරීමෙන් පසු නිරවුල් කිරීම සිදුකළ යුතු අතර, නිරවුල්කිරීම සඳහා තවදුරටත් වගකීමක් නොමැති නම්, එය කොටස් වශයෙන් කපා හැරිය යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ක්‍රිකට් සංගම් වෙත ලබා දී ඇති රු. 10,292,337 ක් වූ අත්තිකාරම් මුදල අයකර නොගෙන තරඟාවලි සඳහා වූ අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් තවදුරටත් ක්‍රියා කළයුතු ලේඛන සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී. | අත්තිකාරම් ආපසු අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.211,234,954 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.470,444,762 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,730,424,952 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු. 517,904,180 කින් අඩුවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ දඹුල්ල හා පල්ලෙකැලේ ජාත්‍යාන්තර ක්‍රීඩා සංකීර්ණවල පිහිනුම් තටාක ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අත්තිකාරම් සහ උපදේශන ගාස්තු ඇතුළුව රු. 115,138,947 ක මුදලක් ගෙවා තිබුණි. ව්‍යාපෘති ආරම්භ කළ දින සිට මාස 6ක් ඇතුළත මෙම ව්‍යාපෘති අවසන් කිරීමට නියමිතව පැවතිය ද, මාස 6කට අධික කාලයක් ප්‍රමාද වී පිළිවෙලින් 2019 දෙසැම්බර් 18 හා 2019 දෙසැම්බර් 04 යන දින වලදී එම ව්‍යාපෘති ආරම්භ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘතිවල ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද අතර, 2021 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘති අවසන් කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **දැනට පවතින ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු - ආර්. ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය** | | |
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 වගන්තියට අනුව ආරම්භක අත්තිකාරම් ලෙස ගෙවිය යුතු උපරිම මුදල කොන්ත්‍රාත් අගයෙන් සියයට 20කි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඉහත අවශ්‍යතාවයට පටහැණි ලෙස රු. 157,635,000ක මුදලක් හෝ කොන්ත්‍රාත් මුදලින් සියයට 40ක මුදලක් ආරම්භක අත්තිකාරම් ලෙස ඉදිකිරීම් සමාගමට ගෙවා තිබුණි. මේ අනුව අත්තිකාරම් වශයෙන් රු. 78,842,500කට වැඩි මුදලක් ගෙවා තිබුණි. තවද, 2020 මැයි 20 දින වනවිට ඉදිකිරීම් අවසන් කළ යුතුව තිබුණ ද 2021 මැයි වනවිටත් එය | අවශ්‍ය අනුමැතිය සහිතව සියයට 40ක අත්තිකාරම් ද, සහතිකයක් ලබාගැනීමෙන් පසුව සියයට 100ක අත්තිකාරම් ද නිකුත් කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ආරම්භක අත්තිකාරම් ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසන් කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් භෞත චිකිත්සක දෙපාර්තමේන්තුව සඳහා රු. 24,270,099 ක් වටිනා භෞත චිකිත්සක උපකරන 2ක් මිලදී ගෙන ඇත. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රසම්පාදන අත්පොතේ vi (2.5) වගන්තිය අනුව රු. මිලියන 1 සිට රු. මිලියන 25 දක්වා ප්‍රසම්පාදනයන් සඳහා විවෘත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, ටෙන්ඩර් කැඳවීමකින් තොරව එම උපකරණ දෙක පිළිවෙලින් ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණි. එම ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීම සඳහා වසරකට වැඩි කාලයක් ගතවී ඇති අතර, තෝරාගත් සැපයුම්කරුගෙන් කාර්යසාධන බැඳුම්කර ලබාගැනීමට කටයුතු කර නොතිබූ අතර, සැපයුම්කරුවන් සමඟ ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | භාවිතා කරනු ලබන දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික කමිටු නිර්දේශ මත පදනම්ව උපකරන මිලදී ගෙන ඇත. | මණ්ඩලයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුව කටයුතු කළ යුතුය. |